Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම තිතටම මීඩියා

## මගෙන් වචනයක්..

සමහර යාලුවො කියනවා ගේ ජිවිතෙ දිනන්න විභාග පාස් වෙන්නම ඕනි නෑ කියල.මෝටිවීශන් අයියල අප්පච්චිලා එම.හරි ඇති.

ඉතින් විභාග ෆෙල් වුන හැම මිනිහම ජිවිතෙ දිනුවද බං ? ඔයා හිතනවද ඔයාගෙ අනික් යාලුවො පාස් කියල කියද්දි ඔයා ෆෙල් කියල හරි ඔයා අඩු සාමාර්ථ අරන් තියෙද්දි හරි ඔයාට දැනෙන හැගීම ලස්සන එකක් වෙයි කියල..ඔයාගෙ අම්මට අප්පච්චිට දැනෙන හැගිම ලස්සන එකක් වෙයි කියල.

එක එකාගෙ වැල් බයිලා වලට යට වෙන්-නැතුව ඔයාගෙ ජිවිතේ අඩියක් හරි ඉස්සරහට එන්න හොදට විභාගේ ගොඩ දාගන්න.ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙ-පා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නෑ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නනන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!



Design by - Creativepixel.lk - Search us on fb/insta

හත් වැනි පාඩම

# නිර්මාණාත්මක සන්නිවේදනය

Creative communication

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023
මීඩියා
COMMUNICATION & MEDIA STUDIES
මොළේටම තිතටම මීඩියා
විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්
HNDIT , mass communication (UG)
076 3950730
071 0538308

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

## 7.1 නිර්මාණාත්මක සන්නිවේදනය

නිර්මාණාත්මක සන්නිවේදනය යන්නෙහි සරල අර්ථය වන්නේ
**කිසියම් සන්දේශයක් ග්‍රාහකයාට වඩාත් සමීපව වැටහෙන ලෙස ප්‍රකාශ කිරීමයි**

නිර්මාණය යන්න පිළිබඳව ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයෙහි සඳහන් වන්නේ
**යම් නිමැවුමක් සඳහා පරිකල්පනය හෝ අපූර්ව අදහසක් භාවිත කිරීමයි.**

කලාව යන්න පිළිබඳව ලියෝ ටොල්ස්ටෝයි දක්වන්නේ
**යමෙකු යම් වේදිතයක් විඳ ගැනීමෙන් පසු චලනල රේඛාල වර්ණල ශබ්ද හෝ වචන සංයෝග සමගින් ඒ වේදිතය ඒ අයුරින්ම අන්‍යයන් තුළ දැනවීම කලාවයි යනුවෙනි**

### නිර්මාණශීලීත්වය හා සන්නිවේදනය අතර ඇති අවියෝජනීය සම්බන්ධය

අතීතයේ මානවයා සන්නිවේදනය පිණිස භාවිතා කළ ශිල්ප ක්‍රම පසු කාලීනව කලා ක්‍රම බවට පත්වීම.

ඒ ඒ මානව සංස්කෘතිවල මිනිසාට නිර්මාණාත්මක සන්නිවේදන බලපෑම් සිදුව ඇත්තනේ
**චිත්‍ර ශිල්පය - ඩාවින්චි**
**සාහිත්‍ය - ශේක්ෂ්පියර්**
**සංගීතය - බිතෝවන් වැනි ක්ෂේත්‍රවල**
කලා කෘති හා අවශේෂ නිර්මාණකරුවන් හේතු කාරක කරන කොට ගෙනය.

සියලුම මාධ්‍ය නිර්මාණාත්මක සන්නිවේදනය පදනම් කොට සන්දේශ ඉදිරිපත් කරන අතර සාර සන්නිවේදනයක් උදෙසා නිර්මාණශීලීත්වය අත්‍යාවශ්‍ය වීම.

### නිර්මාණාත්මක සන්නිවේදනයේ ස්වභාවය

ප්‍රාග් මානව අවධියේ සිට මානවයා ඉන්ද්‍රීය බද්ධ හා පරිසර බද්ධ වූ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදිණි.

මිනිසා ශිෂ්ටාචාර වෙන්ම නිර්මාණශීලී සන්නිවේදන ක්‍රම නර්තනය ගායනය වාදනය ආදී ප්‍රමුඛ කලා ක්‍රම බවට පත්වීම.

14 සහ 17 වන සියවස්වල(මධ්‍ය කලීන යුගයේ) කලා ප්‍රබෝධය සහ අධ්‍යාපන ක්‍රම වර්ධනය සමග ඒ ප්‍රමුඛ කලා නවීනත්වයට පත්විය.

මානව සංස්කෘති ගොඩ නැගීමෙහිලා නිර්මාණාත්මක සන්නිවේදන ක්‍රම බෙහෙවින් ඉවහල් වී ඇත.

කාර්මීකරණයෙන් පසුව මාධ්‍ය තාක්ෂණයේ වර්ධනය වීමෙන් බිහි-වන ජනමාධ්‍ය ක්ෂේත්‍රය හේතුවෙන් මානවයාගේ දෛනික ජීවිතයට නිර්මාණාත්මක සන්නිවේදනය වඩාත් සමීප විය.



### නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාව හා වැදගත්කම

නූතන මිනිසාට දෛනික ජීවිතය හා වෘත්තීය ජීවිතය ශක්තිමත් හා ප්‍රබෝධමත් කර ගැනීමට.

සම්මත ඇවතුම් පැවතුම් සහිත අක්‍රීය පුරවැසියා නව පුරවැසි-යකු ලෙස සක්‍රීය කිරීමට.

සතුට සැහැල්ලුව අධ්‍යාත්මික ප්‍රබෝධය හා චිකිත්සාව වැනි මානව වුවමනා ඉටුකර ගැනීම සහ පෝෂණය කර ගැනීම සඳහා.

සංකීර්ණ සහ අවිවේකී වත්මන් මානව ස්වභාවය ජය ගැනීමට.

ගැඹුරු සංකල්ප හා දර්ශනවාද පහසුවෙන් අවබෝධ කර ගැනීමටත් විවිධ විකල්ප දැනුම් පරාස හඳුනාගෙන ජීවිතයේ මධ්‍යස්ථභාවය හඳුනා ගැනීමටත් නිර්මාණාත්මක සන්නිවේදනය වැදගත්වේ.

විෂයානුබද්ධව අන්තර්වර්තී පුද්ගලාන්තර සමූහ ජන සහ අතථ්‍ය සන්නිවේදන ක්ෂේත්‍රවල ප්‍රබල සන්නිවේදකයෙකු වීමට.

අධ්‍යාපනය විනෝදය තොරතුරු සහ පෙලඹවීම වැනි සන්නිවේදන කාර්ය ප්‍රබල ලෙස ඉටුකර ගැනීමට.

ග්‍රාහකයා ආකර්ෂණය කර ගනිමින් ප්‍රලබ ලෙස සන්දේශ ඉදිරිපත් කිරීමට

**ජේමස් වොට්සන් නැමැති ආචාර්යවරයා සන්නිවේදන අධ්‍යයනය යනු කුමක්ද? යන පොතෙහි නිර්මාණාත්මක සන්නි-වේදනය මගින් කරුණු දහයක් ඉටුකර ගත හැකි බව දක්වන ලදී**

ගැටලු විසඳා ගැනීමට හේතුවේ.
පෙලඹවීමක් ඇති කරයි.
උද්යෝගීභාවයෙන් යුතු ක්‍රියාශීලීත්වයක් ඇති කරවයි.
අදහස් පණ ගැන්වීමට උපකාරී වෙ.
පවතින දෙයක් කෙරෙහි අභියෝගයක් ඇති කරවයි
නිර්මාණශීලීත්වය යනු ගවේශනය කිරීමයි.
කණ්ඩායම් කටයුතු වලට වැදගත්වේ
සෙසු අයගෙ නිර්මාණශීලීත්වයට ඇගයුමට උපකාරී වේ.
නිර්මාණශීලීත්වය විවෘත හා නම්‍යශීලී වේ.
කාර්ය තෘප්තිය ඇති කරවයි.

## 7.2 නිර්මාණශීලීත්වයේ මූලිකාංග හඳුනා ගැනීම

නිර්මාණශීලීත්වයේ මූලිකාංග යන්නෙන් අදහස් වන්නේ නිර්මාණකරුවා සහ නිර්මාණ කාර්යය සම්බන්ධයෙන් අනාංවශ්‍යා වූ ගුණාංග හඳුනා ගැනීමයි.

**නිර්මාණශීලීත්වයේ මූලිකාංග**
1 නිර්මාණය / නිර්මාණශීලීත්වය
2 නිර්මාණාත්මක චින්තනය
3 නිර්මාණ ශිල්පියා
4 නිර්මාණාත්මක රචනය.

# 1. නිර්මාණය

නිර්මාණය යන්නෙන් ප්‍රකාශ වනුයේ පෙර නොවූ විරූ යන අදහසයි. ඊට නවෝත්පාදනය යැයිද කියනු ලැබේ

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ (2015) නිර්මාණය හදුන්වන්නේ අලුත් යමක් නිපදවීමේ ක්‍රියාව හෝ ක්‍රියාවලිය ලෙසිණි.

නිර්මාණයක් බිහිවන්නේ නිර්මාණකරුවකුගේ කුසලතාව ප්‍රතිභාව පරිකල්පනය ව්‍යුත්පත්තිය සතතාභ්‍යාසය හා බහුශ්‍රැතතාව මෙන්ම දාර්ශනික සංකල්පනා සහ අරමුණු වැනි බහුවිධ සාධක ඔස්සේය.

නිර්මාණය යන්න විවිධ මාධ්‍යවල විවිධාකාරයෙන් භාවිතා වේ. එක් එක් මාධ්‍යට ගැළපෙන ලෙස නිර්මාණ සකස් කිරීමේ දී නිර්මාණකරුවා මාධ්‍ය හා මාධ්‍ය තාක්ෂණය පිළිබඳ අවබෝධයකින් යුතුව නිර්මාණ කාර්යය කළ යුතුය.

## නිර්මාණශීලිත්වය

නිර්මාණශීලිත්වය යනු නිර්මාණයක් බිහි කිරීමෙහිලා නිර්මාණකරුවෙකු සතු හැකියාවයි. එය ප්‍රතිභාව එනම් අන්තර්ඥානය/ප්‍රතිභානය ලෙස පෙරදිග රසාස්වාදයේ දැක්වෙන අතර එය පුද්ගලයකුට උපතින්ම ලැබෙන ශක්තියක් මෙන්ම වාසනා ගුණයක් ලෙස කියවෙයි.

## නිර්මාණශීලිත්වයේ මූලික ලක්ෂණ

පෙර නොවූ විරූ ආකාරයෙන් ලෝකය සංජානනය කිරීමට ඇති හැකියාව.
සැගවුණු රටා දැකීම.
සබඳතාවයන්/නොපෙනෙන ප්‍රපංච/සංසිද්ධි අතර සබඳතා ගොඩනැගීම.
විසඳුම් උත්පාදනය

**ලියනාඩෝ ඩා විංචි නිර්මාණශීලිත්වයේ මූලිකාංග පිළිබඳව දක්වන ලද කරුණු**

කුතුහලය / දුර්හලන්වය
සුවිදර්ශනය / නිරූපනය
සංවේදනය
සාධුගමනය / මෘදුභාවය
කලාවිද්‍යා තුල්‍යතාව
කායික මානසික තුලාතාව
සම්බන්ධතා

**මෙයට අමතරව නිර්මාණශීලි කාර්ය කිරීම සඳහා වන මූලිකාංග විවිධ අධ්‍යයන ඔස්සේ හඳුනාගෙන ඇති ඒවායින් කිහිපයක්**

සංවේදනය
පරිකල්පනය
ප්‍රත්‍යක්ෂණය
සංජානනය
අද්දැකීම් ප්‍රතිවින්දනය
ප්‍රස්තුත ගවේෂණය
සතතාභ්‍යාසය
කුසලතා හා භාවිතය



## 2 නිර්මාණාත්මක චින්තනය

නිර්මාණයක් බිහිවීමට නිර්මාණකරුවා විවිධාකාරයෙන් ලබා ගන්නා ජීවන අත්දැකීම් වස්තු විෂය වේ.

**නිර්මාණකරුවෙකුට අත්දැකීම් ලැබෙන මූබය ක්‍රම 3කි**
ස්ව අත්දැකීම්
අන්‍යයන්ගෙන් ලබන අත්දැකීම්
මාධ්‍ය හෝ වෙනත් අත්දැකීම්

**ස්ව අත්දැකීම්**
තමා විසින් අත්විඳි දේ අත්දුටු දේ නිර්මාණයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීම.

**අන්‍යයන්ගෙන් ලබන අත්දැකීම්**
තමාඇසුරු කරන සමාජයේ අයෙකු තමා වෙන පැවැසූ අදහසක් වෙනත් පුද්ගලයකුගේ අත්දැකීමක් තමාට ලැබුණු ලිපියක සඳහන් කරුණක් ඔස්සේ නිර්මාණයක් බිහි කිරීම.

**මාධ්‍ය හෝ වෙනත් අත්දැකීම්**
තමන් පරිශීලනය කරන ලද නිර්මාණයක් වෙනත් නිර්මාණක් ගොඩනැගීමට ඉවහල්වීම.

නිර්මාණකරුවෙකු කුමන හෝ ක්‍රමයකින් උකහා ගන්නා අත්දැකීම් නිර්මාණයක් බවට පත් කරනුයේ ස්වකීය නිර්මාණාත්මක චින්තනය මෙහෙයවීමෙන් පරිකල්පනයේ යෙදීමෙනි.

**පරිකල්පනය යනු නිර්මාණකාර්ය සඳහා අවශ්‍ය සංකල්ප□ චිත්ත රූප ගොඩනගා ගනු පිණිස නිර්මාණකරුවෙකු සතු ශක්තියයි**

මෙහිලා ප්‍රතිභාව සතතාභ්‍යාසය සහ ව්‍යුත්පත්තිය ඉතා වැදගත් වන්නේ එමගින් පරිකල්පනය වඩා වඩාන් සියුම් හා තියුණු කෙරෙන හෙයිනි.

පවත්නා අදහස් ඒකාබද්ධ කිරීම හෝ නැවත සකස් කිරීම මගින් නව අදහස් උත්පාදනය කිරීමේ චින්තන හැකියාව මෙන්ම වෙනස්කම් හා නව අදහස් පිළිගැනීමට දක්වන ආකල්පය හා දෘෂ්ටිය නම්‍යශීලීභාවය නිර්මාණාත්මක චින්තනයට අයත් වේ.

**බ්‍රිතාන්‍ය සමාජ විද්‍යාඥ ග්‍රැහැම් වෝල්ස්** 1926 **දී ඔහුගේ** The art of thought **නම් කෘතියේ නිර්මාණාත්මක චින්තනයට අදාල ක්‍රියාදාම හතරක් පෙන්වා දී ඇති**

සකස්කිරීම
පෝෂණය
ප්‍රදීපනය
සත්‍යාපනය

**සකස් කිරීම**
ප්‍රස්තුතය සවිඥානිකව ක්‍රමානුකූලව විමර්ශනය කිරීම.

**පෝෂණය**
ප්‍රස්තුතය පිළිබඳ සවිඥානිකව සිතීමෙන් වැළැකී සිටීමෙන් එය පෝෂණය වේ.

**ප්‍රදීපනය**
නිර්මාණශීලි අදහසණී ආශ්‍රිත එසැනින් ඇතිවන ආවේශයෙන් නිර්මාණයට අදාළ ප්‍රදීපනය බිහිවේ.

**සත්‍යාපනය**
නව අදහසෙහි වලංගුභාවය පරීක්ෂා කර අදහස නිශ්චිත නිර්මාණාත්මක ආකෘතියකට ගනු ලබයි.

## 3 නිර්මාණ ශිල්පියා

නිර්මාණයේ නිමැවුම්කරුවා නිර්මාණ ශිල්පියා ලෙස හැඳින්වේ.

යම් දෙයක් සැදූ හෝ නිපදවූ පුද්ගලයා නිර්මාණකරු ලෙස ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය නිර්වචනය කරයි.

නිර්මාණකරුවෙකු හෝ නිර්මාණ ශිල්පියෙකු වීම කෙටි කාලීන පුහුණුවක ප්‍රතිඵලයක් නොවේ. එය කලාව සමාජය සංස්කෘතිය දේශපානය පිළිබඳ අවබෝධාත්මක අත්දැකීමෙන් ද සමාජ මනෝ හා මානව විද්‍යා දිර්ඝ කාලීනව හැදෑරීමෙන් ද වර්ධනය කර ගත යුත්තකි.

මෙලොව උපදින සෑම පුද්ගලයෙක්ම කිසියම් හෝ නිර්මාණ ශක්තියක් සහිතව උපදින අතර එය නිසි ලෙස වර්ධනය කර නොගතහොත් එම හැකියා කාලානුරූපීව ගිලිහී යනු ඇත.

## 4 නිර්මාණශීලි රචනය

නිර්මාණශීලි රචනය යන්නෙන් අදහස් කරන්නේ කිනම් හෝ ශෛලියකින් රචකයෙකු විසින් නිර්මාණශීලි මනසින් ලියනු ලබන ලේඛනයකි. එය වෘත්තාන්තයක් නව කථාවක් කෙටි කනාවක් කවියක් හෝ වෙනත් නිර්මාණශීලී පාඨයක් විය හැකිය.

නැවුම් භාෂා ශෛලියකින් රසිකයා තුළ චින්තාකර්ෂණීය භාවයක් ඇති කරවීමට ලියැවෙන ලේඛනය නිර්මාණශීලි ලේඛනය හෙවත් නිර්මාණශීලි රචනය නම් වේ.

නිර්මාණශීලි රචනයේ අරමුණු වන්නේ රසිකයාට සිතුවිලි හැඟීම් සහ රසභාව පූර්ණ චිත්ත තත්ත්වයක් ඇති කිරීමයි.

තිර රචනය ගුවන්විදුලි පිටපත් රචනය තීරුලිපිය විශේෂාංග හා වෙළඳ දැන්වීම් පිටපත් නිර්මාණශීලී රචනා වලට නිදසුන් වේ.

නිර්මාණශීලී රචනා සඳහා යොදා ගනු ලබන භාෂාව රසවත් විය යුතුය. ව්‍යංගාර්ථ පූර්ණය පරිකල්පනය පුබුදු කරවන සුලු රසිකයන් සනසවන සුලු සිනහව ප්‍රහර්ෂය සන්තාපය වැනි සංවේදන ඇති කරවන සුලු විය යුතුය.



## 7.3 නිර්මාණශිලි භාෂා භාවිතය

මානව ශිෂ්ටාචාරයේ මිනිසා දිනාගත් විශිෂ්ටතම දායාදය නම් මානවයාගේ භාෂාව නිර්මාණය කර ගැනීමයි. භාෂාව නිපදවා ගැනීම ඔස්සේ මානව සන්නිවේදනය වේගයෙන් සංවර්ධනය විය.

භාෂාව වචන නොවන ශබ්ද වලින් ජනනය වේ.
මිනිසාට භාෂාව නිසා ලැබී ඇති කුසලතා සංවිධානයවීමේ හැකියාව.
තර්කානුකූලව යමක් වටහා ගැනීමේ හැකියාව
යමක් මතකයෙහි තැන්පත් කර ගැනීමේ හැකියාව හා අවශ්‍ය විටක සිහි කැඳවා ගැනීමේ හැකියාව.
ලිඛිත භාෂාව ඔස්සේ දැනුම ගබඩා කර ගැනීමේ හැකියාව.
පූර්වයෙන් නිෂ්පාදිත දැනුම් කියවා වටහා ගැනීමේ හැකියාව.
භාෂාව විසින් ජන කණ්ඩායම් ගොඩ නගනු ලැබීය.

භාෂාව හේතු කොටගෙන ජන කණ්ඩායම් ප්‍රජාවන් අතර ඔවුනොවුන්ට ආවේනික සංස්කෘතීන් බිහි කරනු ලැබිණි. එකී සංස්කෘතීන් ඔස්සේ ජාතීන් බිහිවිය. ජාතීන් විසින් දේශසීමාවන් වෙන් කර ගනිමින් ජීවත්වීම ඇරඹීමෙන් රටවල් බිහිවිය.

භාෂා භාවිතයේ නිර්මාණශීලීත්වය කථා කිරීම (කථනය) සවන්දීම (ශ්‍රවණය) ලිවීම (ලේඛනය) සහ කියවීම පදනම් කොට ගෙන ගොඩ නැගේ.

**ගුවන්විදුලිය බස ශබ්දය හා ශ්‍රවණය මත පදනම් වේ**
මුද්‍රිත මාධ්‍යවලදී ලිඛිත භාෂා ප්‍රමුඛ වන අතර දෘශ්‍ය රූප යනාදිය භාවිත වෙ.

**රූපවාහිනී මාධ්‍ය බස ශබ්ද මාධ්‍ය භාෂාවේ හා දෘශ්‍ය මාධ්‍ය භාෂාවේ හා දෘශ්‍ය මාධ්‍ය භාෂාවේ දිගුවක් වෙ.**
නාට්‍ය කාලාවේදී යථාර්ථවාදී ප්‍රවේශය ද දැන්වීම් කලාවේදී මනෝවිද්‍යාත්මක ප්‍රවේශය ද යොදා ගැනේ.

**සිනමාවේ භාෂාව රූපය වේ.** එහි ව්‍යාකරණය වන්නේ සංස්කරණයයි.

නිර්මාණශීලී භාෂාවේ මූලික කාර්ය වන්නේ භාෂාව පදනම් කර ගනිමින් ග්‍රාහකයාට සන්දේශය නිර්මාණශීලීව සන්නිවේදනය කිරීමයි. ඒ සඳහා ලිඛිත සන්නිවේදනය වාචික හා නිර්වාචික සන්නිවේදනය දෘශ්‍ය හා ශබ්ද සන්නිවෙදනය භාවිතා වේ.

## පුවත්පත හා නිර්මාණශීලී භාෂා භාවිතය

පුවත්පත් භාෂාව පෙළ හා රූපයෙන් සමන්විත වේ.
පෙළ යනු ලිඛිත භාෂා ව්‍යවහාරයයි.

රූප යන්නට අයත් දෑ
ඡායාරූප
චිත්‍ර
සිතියම්
අක්ෂර
විවිධ අලංකාර ක්‍රම
වර්ණ භාවිතය
පිටු සැකසුම.

### ප්‍රවෘත්ති
සරල සෘජු වැනි සහිත භාෂාවක් භාවිතා කරයි.
ප්‍රවෘත්තියක නිර්මාණාත්මක භාෂා භාවිතයට වැඩිම ඉඩක් පවතින්නේ ශීර්ෂ පාඨ වලය.

### විශේෂාංග

විශේෂාංග යටතට අයත් දෑ
විශේෂාංග ලිපි
තීරුලිපි
කතුවැකි
පාඨක අදහස්
චිත්‍රපට වාර්තා

පුවත්පතේ මතවාදය ඉදිරිපත් කරන්නේ කතුවැකියෙනි.

කතුවැකිය සංස්කාරක වැකියණී සංස්ලේඛනය ලෙස ද හැඳින්වේ.

විශේෂාංග ලිපි ලිවීමේ දී පාඨක අවධානය යොමුවන ආකාරයේ මාතෘකා යොදා ගත යුතුය.

තීරුලිපි රචනයේ දී රචකයාගේ භාෂා අනන්‍යතාව මෙන්ම ආකෘතියටද වැඩි තැනක් හිමිවේ.

තීරුලිපියක් විස්තර වාර්තාවක් කවි පන්තියක් ලෙස ද නිර්මාණය කළ හැකිය.

### දැන්වීම්
දැන්වීම් වර්ග තුනකි.
ප්‍රධාන දැන්වීම්
ප්‍රධාන දැන්වීම් පුවත්පතේ පුලුල් ඉඩකඩක පලවේ
ලුහුඩු දැන්වීම්
ලුහුඩු දැන්වීම් පුවත්පතේ සුලු ඉඩකඩක පලවේ.
උපදේශනාත්මක දැන්වීම්

### පොත් / ග්‍රන්ථ
භාෂාවේ නිර්මාණශීලීත්වය වඩාත් දැකගත හැකිවන්නේ මුද්‍රිත පතපොතනි.



**සඟරා**
විවිධ විෂයන් මෙන්ම විවිධ පාඨක කණ්ඩායම් ඉලක්ක කොටගෙන සඟරා නිකුත්වේ.

සඟරාවේ නිර්මාණශීලීත්වය උදෙසා එහි භාෂාවේ රිද්මය අක්ෂර හැඩතල සටහන් වර්ණ පිටු සැලසුම් වැදගත් කාර්යයක් ඉටු කරයි.

### ගුවන්විදුලිය

ගුවන්විදුලිය හඬ ආත්මය කොටගත් ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි.
ගුවන්විදුලි භාෂාව මිනිස් හඬ සංගීතය ස්වභාවක ශබ්ද ශබ්ද ප්‍රයොග නිහඬතාව සංකලනය වීමෙන් සකස් වී ඇත.
ගුවන්විදුලි මාධ්‍යයේ දී හඬ නිර්මාණාත්මක නාට්‍ය ආකාරයෙන් ග්‍රාහක ස්ථානයේ සිටින ශ්‍රාවකයා ඉලක්ක කරගෙන සකස් කරයි.

ගුවන්විදුලි වැඩසටහන් ආගමික අධ්‍යාපනික සංවර්ධන වෛද්‍ය කෘෂිකාර්මික ක්‍රීඩා ළමා කාන්තා ලෙස වර්ග කළ හැකිය.

ගුවන්විදුලි මාධ්‍ය භාෂාවේ ලක්ෂණ
සරලබව
එක්වරකින් තේරුම්ගත හැකිබව.
සවන කේන්ද්‍රීය එළ ඹුම.
දිගු සංකීර්ණ වාක්‍ය යොදා නොගැනීම.
අන්තර්වර්ති පුද්ගල සනනිවේදනයට අවකාශ සැලසීම.
ඉලක්ක ග්‍රාහක අද්දැකීම් පසුතලයට ආමන්ත්‍රණය කිරීම.
ශ්‍රාවකයාගේ මනසට හසුවන ලෙස ගුවන්විදුලි භාෂා භාවිතයෙන් චිත්ත රූප මැවීම
ගුවන්විදුලියේ පහල වූ නිර්මාණාත්මක අභියෝගය වෙ.

ගුවන්විදුලි නිවේදකයින් නාට්‍ය වැඩසටහන් ඉදිරිපත් කරන ශිල්පීන් කථිකයින් ශ්‍රාවකයා ආරක්ෂණය කර ගනු ලබන්නේ ස්වීය භාවිතය මගිනි. මෙහිදී කටහඬෙහි මධුරහව තීව්‍රබව පැහැදිලි හා නිරවුල්ව වචන උච්චාරණය උචිත වාග් සංයමය පුහුණු කළ යුතුය.

**ශබ්ද භවිතයේ දී හඬෙහි උච්චාරණය□ හැගීම් හා භාව කථනය ළයාන්විත බව හා සුහදබව රැක ගැනීම නිර්මාණය කෙරෙහි ග්‍රාහකයා ආරක්ෂණය කර ගැනීම නිර්මාණය කෙ- රෙහි ග්‍රාහකයා ආකර්ෂණය කර ගැනීමට හේතු වේ**

## රූපවාහිනී මාධ්‍ය

රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය ජනමාධ්‍යක් ලෙස හැදින් වේ. දෘශ්‍ය සන්නිදෙනයට ප්‍රමුඛත්වය හිමිවේ.

රූපවාහිනිය සම්භාව්‍ය කලාවට එතරම් අවකාශයක් ලබා නො-දෙන අතර මෙම මාධ්‍ය සැලකෙන්නේ **Glamorous** මාධ්‍යයක් ලෙසයි.

රූපවාහිනිය අලංකාරික හා ජනප්‍රිය හා නිර්මාණාත්මක ගුණාංග මත රදා පවතී. එමගින් ප්‍රධාන වශයෙන්ම නව්‍යතාව සපලදායී හා අපූර්වවීම අදහස් වෙ.

## රූපවාහිනිය මාධ්‍ය සතු වැඩසටහන් කොටස් දෙකකි

වෘත්තාන්ත.
වෘත්තාන්ත නොවන.

## වෘත්තාන්ත වැඩසටහන්

ටෙලිනාට්‍ය
ටෙලිචිත්‍රපට
කාටූන් කතන්දර

## වෘත්තාන්ත නොවන වැඩසටහන්

ප්‍රවෘත්ති
වාර්තා
විවිධාංග වැඩසටහන්

මෙයට අමතරව ළමා කාන්තා ක්‍රීඩා චාරිකා වශයෙන් ද තවත් වර්ගීකරණයක් දැක්විය හැකිය.

රූපවාහිනී නාට්‍ය යනු සාමූහික නිර්මාණාත්මක කාර්යයකි. රූපවාහිනී මාධ්‍ය නිර්මාණකරණයේ පදනම රූපවාහිනී රචනයයි.

## <u>සිනමාව</u>

සිනමාව ලෝකයේ ඇති ප්‍රධාන කළා මාධ්‍යයකි. එයට විශේෂිත භාෂාවක් හා වාග්කරණයක් ද වර්ධනය වී ඇත.

ප්‍රධාන චිත්‍රපට ප්‍රවර්ග ලෙස ක්‍රියාකාරී වික්‍රමාන්විත සජීවීකෘත චරිතාපදාන කාටූන් හාස්‍යොත්පදක වාර්තා සංත්‍රාස ප්‍රේම සංගීත විද්‍යා ප්‍රබන්ධ ත්‍රාසජනක යුද්ධ ලෙස වර්ගීකරණය කළ හැකිය.

චිත්‍රපට අධ්‍යක්ෂණයේ දී සිනමා තිර රචනයණී අධ්‍යක්ෂණයණී සිනමා තාක්ෂණය සංස්කරණය වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

සිනමාවේ නිර්මාණාත්මක ප්‍රවේශ ලෙස සිනමාත්මක චල වින්දන ශබ්ද වින්දන කාලින නාට්‍යමය සිනමා නිර්මිතය වැනි ක්ෂේත්‍ර වැදගත් වෙ.

සිනමා මාධ්‍යයේ නිර්මාණාත්මක රචනයේ දී දෘශ්‍ය මෝස්තරය රූපක හා සංකේත භාවිත කෙරේ. එය තිර රචනය නමින් හැදින් වේ.

තිර රචනය චිත්‍රපටයක නිර්මාණාත්මක පදනම් ලියවිල්ල වේ.



## රූපවාහිනිය හා සිනමා නිර්මාණකරණයේ දී භාවිත වන කැමරා කෝණ

සමීප රූපය
ඉතා සමීප රූපය
අතිසමීප රූපය
මධ්‍යම රූපය
මධ්‍යම සමීප රූපය
මධ්‍යම දුර රූපය
අතිදුර රූපය
ඉතා දුර රූපය
දුර රූපය
මධ්‍යම සමීප රූපය යටිකුරු දැක්ම '
දුර රූපය උඩුකුරු දැක්ම

## රූපවාහිනී සහ සිනමා නිර්මාණකරණයේ දී කැමරා චලන කිහි-පයක් හඳුනාගත හැකිය

### Panning

කැමරාව තිරස්ව වමට හෝ දකුණට ගමන් කරවීම හෝ ගෙනයාමයි.

### Tilting

කැමරාව උඩට හෝ පහලට කිරීම මගින් රූප සටහන් කර ගැනීම.

## <u>රංග භූමි</u>

රංග කලාව මානව ප්‍රකාශනය හා ගවේෂණය උදෙසා ප්‍රබල මාධ-ප්‍යක් ලෙස පැවැත එන්නකි.

රංග භූමිය රංග කලාව සහයෝගිතා කලාවක් ලෙස හැදින් වේ.

රංග කලාව පිළිබඳව අවබෝධය අන්තර් පුද්ගල චින්තනය හා ව්‍යවහාරික කුසලතා පෝෂණය කර ගැනීම පිණිස අවස්ථාව උදාකර දේ.

## රංග කලාවේ මූලිකාංග

සාහිත්‍ය මූලිකාංග
තාක්ෂණික මූලිකාංග
ප්‍රාසංගික මූලිකාංග

## සාහිත්‍ය මූලිකාංග

ප්‍රස්තුතය
කතාවස්තුව හා එහි ආකෘතිය
උච්චස්ථාන (මුල මැද අග යනාදිය)
චරිත
විවරණය
භාෂාව
ශෛලිය
ඒකපාත්‍ර භාෂණය

**තාක්ෂණික මූලිකාංග**
ජවනිකා
ඇඳුම්
රංග භාණ්ඩ
අලෝකය
ශබ්ද
වේෂ නිරූපණය
නිෂ්පාදනය

**ප්‍රාසාංගික මූලිකාංග**
රංගනය
චරිත අභිප්‍රේරණ
චරිත විශ්ලේෂණය
සහවේදනය ද කථනය
ශ්වාස සංයමය
වාචික ප්‍රකාශනය
ආවර්ජනය
කථන ප්‍රක්ෂේපණය
කථන ශෛලිය හා වාග්ව්‍යවහාරය
අභිනය
කායික භාෂාව
මුහුණේ ප්‍රකාශනය
චලන

**නිර්මාණාත්මක සන්නිවේදන කාර්යයේ දී ජනශ්‍රැති හා ජනකලා භාවිතය**

ජනශ්‍රැති හා ජනකලා ජනයාගේ අද්දැකීම් පසුකතලයට සමීපවී ගොඩනැගී ඇති බැවින් නිර්මාණකරණයේ දී ඒ අද්දැකීම් භාවිත කිරීමට හැකිවීම ඵලදායි සන්නිවේදනයට හේතුවේ.

ජනශ්‍රැති හා ජනකලා ඇසුරු කිරීම මගින් කෙරෙන නිර්මාණ ඔස්සේ තමාට තම ජන කණ්ඩායමේ විඥානයට සමීපය යන හැඟීමක් ජනනය කළ හැකිය. එය ග්‍රාහක ආකර්ශනයවර්ධනය වීමට හේතුවේ.

ජනශ්‍රැති හා ජනකලාවල භාවිත සංකේත ඉදිරිපත් කරන සමාජ අවස්ථා පහසුවෙන් අවබෝධ කර ගැනීමට ඇති අවකාශ නිසා එමගින් ඉදිරිපත් කරන සංකේත ග්‍රාහකයාට ග්‍රහණය කර ගැනීමට හැකිවේ. මේ නිසා නිර්මාණය කෙරෙහි ගොනැගෙන විශ්වසනීයත්වය ප්‍රබල වේ.

**ලහිරු කේ මදුශාන්**
mass com (UG) UOK
Dip in Tele media and mass com (SLMTI)
DIT (NIBM)